සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

07 ශ්‍රේණිය **ඉතිහාසය** කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට වරහන තුළ දී ඇති වචන වලින් හිස්තැන් පුරවන්න.

01 තෝනිගල සෙල්ලිපියේ මහ කන්නය හඳුන්වා ඇත්තේ ........................................................................ නමිනි.

02 චෝල රාජ්‍යයේ අගනුවර ........................................................................................................ නමින් හැඳින්වේ.

03 පරාක්‍රමබාහු කුමරා උපන් ස්ථානයේ ............................................................................ චෛත්‍යය ඉදිකර ඇත.

04 ග්‍රීසියේ ස්වර්ණමය යුගය ඇති වූයේ ............................................................................ පාලකයාගේ කාලයේය.

05 වෙළඳපොල පාලනය පිළිබඳ නීතිරීති කිහිපයක් පැනවූයේ ...................................................... රජතුමා විසිනි.

(තන්ජෝරය, සූතිඝර, පෙරික්ලිස්, මදහස, අකලහස, භාතිකාභය, හතරවන උදය, ථූපාරාමය)

- අංක 6 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 ගම් වැව් තැන වූ අය වපි හමික ලෙස හඳුන්වයි. (     )

07 තෝපා වැව හා දුඹුටුළු වැව ඒකාබද්ධ කර පරාක්‍රම සමුද්‍රය ඉදිකර ඇත. (     )

08 පොළොන්නරුවේ බලය ලබා ගැනීමට සුගලා බිසව නායකත්වය ගෙන කටයුතු කර ඇත. (     )

09 ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් දූපත් අතරින් කුඩාම දූපත ක්‍රීට දිවයිනයි. (     )

10 රෝමයේ පැරණි ස්මාරකයක් වූ කොලෝසියම් ගොඩනැගිල්ල ජූලියස් සීසර්ගේ නිර්මාණයකි. (     )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 අතීතයේ වෙළඳාම දියුණු වීමත් සමඟ බිහි වූ වෙළඳ නගරයක් වන්නේ මින් කුමක් ද?

(1) මාගම (2) මන්නාරම (3) පොළොන්නරුව (4) යාපහුව

12 මහා විජයබාහු රජතුමා පිළිබඳ හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍රයක් වන්නේ මින් කුමක් ද?

(1) සංගමු විහාර ලිපිය (2) දෙවනගල සෙල්ලිපිය

(3) අඹගමුව සෙල්ලිපිය (4) ගල්පොත සෙල්ලිපිය

13 ශ්‍රී ලංකාවේ වෙස්මුහුණු හා රූකඩ කලාවට ප්‍රසිද්ධ ස්ථානයක් වන්නේ මින් කුමක් ද?

(1) උඩුපිල (2) ගම්පොල (3) දුම්බර (4) පිළිමතලාව

14 මෙම රූපයෙන් දැක්වෙන භාණ්ඩ නිපදවා ඇත්තේ කුමන ජාතිකයන් විසින් ද?



(1) ග්‍රීක ජාතිකයන්

(2) රෝම ජාතිකයන්

(3) ප්‍රංශ ජාතිකයන්

(4) චීන ජාතිකයන්

15 රුවන්වැලි සෑයට පූජා කිරීම සඳහා රෝමයෙන් පබලු ගෙන්වූ රජතුමා වන්නේ මින් කවරෙක් ද?

(1) ධාතුසේන රජතුමා (2) විජයබාහු රජතුමා (3) භාතිකාභය රජතුමා (4) මහා පරාක්‍රමබාහු රජතුමා

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර දී ඇති හිස්තැනෙහි ලියන්න.**

16. සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් ඓතිහාසික මූලාශ්‍රවල හඳුන්වා ඇති නම කුමක් ද?

.............................................................................................................

17. යාපනය ආර්ය චක්‍රවර්තී රජ පරම්පරාවේ ආරම්භකයා නම් කරන්න.

.............................................................................................................

18. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද?

.............................................................................................................

19. ශ්‍රී ලංකාවේ ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ දේවාලය කුමක් ද?

.............................................................................................................

20. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ ඇත් දත් හා රන් වැනි දුර්ලභ ද්‍රව්‍ය භාවිතා කර නිර්මාණය කළ ප්‍රතිමාවකි. එය නම් කරන්න.

.............................................................................



(20 x 2 = 40)

**07 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ලෝක සිතියම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01.




(අ) (i) ඉහත සිතියමේ A, B, C අක්‍ෂර වලින් දැක්වෙන්නේ අතීතයේ සිටම ලංකාව සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් තුනකි. එම රටවල් තුන පිළිවෙලින් දක්වන්න.

A .......................................................................................................

B .......................................................................................................

C .......................................................................................................

(ල. 06)

(ii) මෙම සිතියමේ මධ්‍යධරණී මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

.......................................................................................................

(ආ) යාබද සිතියමෙන් දැක්වෙන්නේ ලංකාවේ බිහි වූ රාජධානි කිහිපයකි. A, B, C අක්ෂර වලින් දක්වා ඇති රාජධානි තුන නම් කරන්න.

A .......................................................................................

B .......................................................................................

C .......................................................................................

(ල. 06)



(ඇ) (i) මෙම නිර්මාණය කුමක් ද? (ල. 01)

(ii) මෙය පිහිටා ඇති රට නම් කරන්න. (ල. 01)

(ල. 16)



02. අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෙළඳාමක් පැවැතුණි.

(i) වෙළඳාම සිදුවූ ආකාර දෙක නම් කරන්න.

(ල. 02)

(ii) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න.

A - ගවයන්ගේ පිටේ භාණ්ඩ රැගෙන යාම ..............................................................................

B - මැටි භාණ්ඩ තැනීම සඳහා යොදා ගත් උපකරණය ,..............................................................

C - අතීතයේ බිහි වූ වෙළඳ නගර මුලාශ්‍ර වල හැඳින්වූ නම ..................................................

(ල. 03)

(iii) (A) අතීතයේ ශ්‍රී ලංකාවේ වී වැපිරීමේ සිට අස්වනු නෙලීම දක්වා ගොයම ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ සම්ප්‍රදායික ක්‍රම දෙකක් දක්වන්න. (ල. 02)

(B) විදේශීය වෙළෙන්දන් සංවිධානය වී සිටි වෙළඳ ශ්‍රේණි දෙකක් දක්වන්න. (ල. 04)

03. (i) අනුරාධපුර යුගයේ දීර්ඝ කාලයක් ලංකාවේ පාලන බලය පවත්වාගෙන ගිය රජ පෙළපත් දෙක නම් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ මානවම්ම රාජ්‍ය සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණ තුනක් දක්වන්න. (ල. 03)

(iii) රාජ්‍ය පාලන කටයුතු වල දී රජුට සහාය වූ නිලධාරීන් සම්බන්ධ පහත වගුව සම්පූර්ණ කරන්න.

| කාර්යය | නිලධාරියා |
|---|---|
| ලේඛන කටයුතු භාරවීම | .................................................. |
| පරිපාලන කටයුතු මෙහෙයවීම | .................................................. |
| ගම් පාලනය කිරීම | .................................................. |

(ල. 2 × 3 = 06)

04. (i) අනුරාධපුර යුගයේ නීතිරීති පිළිබඳ සඳහන් ඉතා වැදගත් වූ ශිලා ලිපි දෙක නම් කරන්න. (ල. 02)

(ii) A - මෙම පින්තූරය හඳුනාගන නම් කරන්න.

B - මෙය පිහිටා ඇති ස්ථානය දක්වන්න.

C - මෙම නිර්මාණය කළ රජතුමා කවුද? (ල. 03)



(iii) බුද්ධ ශාසනයේ උන්නතිය සඳහා රජවරු විසින් කරන ලද කාර්යයන් තුනක් දක්වන්න.

(3 x 2 = 06)

05. (i) අනුරාධපුර යුගයේ බහුල වශයෙන් රජකම උරුම වූ ක්‍රම දෙක දක්වන්න. (ල. 02)



(ii) A - මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

B - මෙය පිහිටා ඇති ස්ථානය දක්වන්න.

C - මෙම නිර්මාණය කරවන ලද රජතුමා නම් කරන්න. (ල. 03)

(iii) දෙවන පරාක්‍රමබාහු රජතුමා සතුරන්ගෙන් රට නිදහස් කර ගැනීමට සටන් තුනක් කරන ලදී. එම සටන් තුන නම් කරන්න. (ල. 3 × 2 = 6)

06. අතීතයේ රජරට ශිෂ්ටාචාරය සමයෙන් පසු විවිධ හේතූන් මත රාජධානි කෙටි කාලයක් තුළ තැනින් තැනට මාරු විය.

(i) ලංකාවේ වරින් වර රාජධානි මාරුවීමට බලපෑ ප්‍රධාන හේතු දෙක දක්වන්න. (ල. 02)

(ii) පැරණි ග්‍රීක සමාජය සකස් වී තිබූ කොටස් තුන නම් කරන්න. (ල. 03)

(iii) පහත දැක්වෙන වගුවේ ඇති තොරතුරු වලට අදාළ නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(ල. 06)

| A | B |
|---|---|
| A - කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල දළදා මැදුරක් ඉදිකර දන්ත ධාතුව තැන්පත් කිරීම. | ........................................ |
| B - කව්සිළුමිණ රචනා කිරීම | ........................................ |
| C - ඉබන් බතුතා නම් අරාබි සංචාරකයා ලංකාවට පැමිණීම | ........................................ |
| D - සැළලිහිණි සංදේශය රචනා කිරීම | ........................................ |
| E - ග්‍රීසියේ ප්‍රධාන දාර්ශනිකයෙකි | ........................................ |
| F - බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා | ........................................ |

(ආකිමිඩිස්, තුන්වන විජයබාහු, ගම්පොල යුගය, ඇරිස්ටෝටල්, කෝට්ටේ යුගය, හිපොක්‍රටීස්, දෙවන පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල)

07. පහත උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




(ල. 11)

<u>හරහට</u>

1. පෘතුගීසින් පැමිණෙන විට යාපනයේ පාලකයා.
2. පන්සිය පනස් ජාතකපොත මේ යුගයේ දී සිංහලට පරිවර්තනය විය.
3. රජරට ශිෂ්ටාචාර සමයේ පැවති උත්සවයකි.
4. සාම්ප්‍රදායික කලා ශිල්පයක් වන මේවා විවීම වර්තමානයේ ද දැකිය හැකිය.
5. රෝමයේ රාජාණ්ඩුක්‍රමය පරිහානියට පත් වී මෙම පාලන ක්‍රමය ආරම්භ විය.
6. ග්‍රීක වරුන්ගේ වෙළඳ භාණ්ඩයකි.

<u>පහළට</u>

1. හයවන පරාක්‍රමබාහු රජු යාපනය යටත් කර ගැනීමට මොහු යවන ලදි
2. යුනෙස්කෝ සංවිධානය හඳුන්වා දුන් අස්පෘශ්‍ය උරුමයකි.
3. රුවන්වැලි සෑයට මුල්ගල තැබීමේ උත්සවයේ දී මෙම රජතුමා නාටිකාංගනාවන් පිරිවරාගෙන පුද බිමට පැමිණ ඇත.
4. තෙත් කලාපයේ මෙම ක්‍රමයට වී වගා කරනු ලැබේ.
5. ලංකාවට ඉතා සමීප දකුණු ඉන්දියානු රාජ්‍යකි. (ල. 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. අකලහස 02. තත්ජෝරය 03. සුතිසර 04. පෙරික්ලීස් 05. හතරවන උදය 06. ( ✓ ) 07. (✓)
08. (✓) 09. ( × ) 10. ( × ) 11. (ii ) 12. ( iii ) 13. ( i ) 14. ( iv ) 15. ( iii )
16. මධුපාවිකා 17. විජය කුලංගෙග ආර්ය චක්‍රවර්ති 18. හිපොක්‍රටීස් 19. ඇම්බැක්කේ 20. ඇනීතා දෙවඟන

(2 x 20 = ල. 40)

## II කොටස

01. (අ) (i) A - අරාබිය B - ඉන්දියාව C - චීනය (ල. 06)
(ii) D - (ල. 02)
(ආ) A - අනුරාධපුරය B - පොළොන්නරුව C- කෝට්ටේ (ල. 06)
(ඇ) (i) පැරණි මොහෙන්ජදාරෝ නගරය (ල. 01)
(ii) පකිස්ථානය (ල. 01)
(ල. 16)

02. (i) රට ඇතුළත වෙළඳාම, විදේශ රටවල් සමඟ වෙළඳාම (ආනයනය, අපනයනය) (ල. 02)
(ii) A - තවලම B - සකපෝරුව C - නිගම (ල. 03)
(iii) (A) නියරවල හා කුඹුරේ තැන තැන පොල්පිති සිටුවීම, තෙල් පොගවන ලද පහන් තිර පත්තු කිරීම (ල. 02)
(ii) (B) නානාදේසි , වලඤ්ජියාර් (ල. 04)

03. (i) ලම්භ කර්ණ, මෞර්ය (ල. 02)
(ii) අභ්‍යන්තර ගැටුම් නිසා ස්ථාවර පාලනයක් බිහි නොවීම
සටන් සඳහා රටේ සම්පත් විශාල ලෙස විනාශ වීම
රාජ්‍ය බලය ලබා ගැනීමට දකුණු ඉන්දීය හමුදාව ගෙන්වා ගැනීම
(iii) මහාලේඛක, රටලද්දන්, ගමික (ල. 06)

04. (i) වේවැල් කැටිය ශිලා ලිපිය, අන්නානි කණු (ල. 02)
(ii) A - මිහින්තලේ පුවරු ලිපිය, B - මිහින්තලේ C - හතරවන මිහිඳු (ල. 03)
(iii) විහාර ආරාම තැනවීම, ඒවා නඩත්තුවට අවශ්‍ය ගම්බිම් ප්‍රදානය කිරීම, භික්ෂු අධ්‍යාපනයට අවශ්‍ය පිරිවෙන් ඉදිකිරීම. (ල. 2 × 3 = 6)

05. (i) පියාගෙන් පුතාට, වැඩිමහල් සහෝදරයාගෙන් බාල සහෝදරයාට (ල. 02)
(ii) A - සිංහ පාදය හා පිය ගැටපෙළ
B - සීගිරිය
C - කාශ්‍යප රජතුමා (ල. 03)
(iii) කාලිංග මාඝ පලවා හැරීම, චන්ද්‍රභානුගේ පළමුවන ආක්‍රමණය
පරාජය කිරීම, චන්ද්‍ර භානුගේ දෙවන ආක්‍රමණය,
පරාජය කිරීම (ල. 2 × 3 = 6)

06. (i) ආරක්ෂක හේතු, ආර්ථික හේතු (ල. 02)
(ii) ප්‍රභූන්, සාමාන්‍ය වැසියන්, වහලුන් (ල. 03)
(iii) A - තුන්වන විජයබාහු රජු B - දෙවන පරාක්‍රමබාහු රජු
C - ගම්පොල යුගය D - කෝට්ටේ යුගය E - ඇරිස්ටෝටල්
F - හිපොක්‍රටීස් (ල. 06)

07.

| හරහට | | පහළට | |
|---|---|---|---|
| 1. | සංකිලි | 1. | සපුමල් කුමරු |
| 2. | කුරුණෑගල | 2. | රංගකලාව |
| 3. | වප්මගුල | 3. | දුටුගැමුණු |
| 4. | පැදුරු | 4. | හෙල්මළු |
| 5. | සමුහාණ්ඩු | 5. | පාණ්ඩව |
| 6. | වයින් | | |

(ල. 11)